මෛත්‍රීපාල සිරිසේන
Maithripala Sirisena
හයවන විධායක ජනාධිපති
The 6th Executive President

# අලුත් අවුරුදු පණිවුඩය

ශ්‍රී ලාංකික සංස්කෘතික උරුමයන් අතුරින් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සුවිශේෂ වන්නේ අපගේ ජන සමාජයේ සාමය, සතුට, සෞභාග්‍ය පිරි වසරක් ගෙවී නව වසරක් අරඹන සුබ හෝරාවක් ලෙසය. එය පවුලේ සියලු දෙනා සමග පමණක් නොව ඉන් ඔබ්බට ගොස් ජන සමාජයේ බොහෝ දෙනා සමග එක්ව සමරන්නට අපට ලැබුණු මහඟු දායාදයක් වශයෙනි.

මෙවර අලුත් අවුරුද්ද අප සමරන්නේ වසර තුනකට ආසන්න කාලයක් අප සමාජයේ මුහුණ දුන් වේදනා බර කාලය අවසන් කිරීමේ පසුබිමක බව පෙනේ. එමෙන්ම සමාජ හා දේශපාලන වශයෙන් රට තුළ පැවති අසහනකාරී තත්ත්වය ද භූගෝලීය වශයෙන් රටට බලපෑ විවිධ ව්‍යසනයන්, අභ්‍යන්තර හා බාහිර කුමන්ත්‍රණවල එල විපාක ද පසුගිය කාලය තුළ අප සමාජය දරුණු ලෙස කඩා වැටීමට හේතු සාධක විය. අප මෙම තත්ත්වයට මුහුණ දෙමින් ඉන් මිදීම සඳහා ඉතාම වේදනා බර ක්‍රියාකාරකම් තවදුරටත් අත්විඳිමින් තිබෙන කාලයක් බව සිහිපත් කළ යුතුව ඇත.

එමෙන්ම මෙවර අලුත් අවුරුද්ද සාමය සතුට පිරි සුබ අලුත් අවුරුද්දක් මෙන්ම ජාතික සමගියෙන් පිරි ස්වයංපෝෂිත දේශයක් ගොඩනැගීමට අප එක්ව කටයුතු කරන කාල පරිච්ඡේදයක් කරගැනීම පරම වගකීම ලෙස මම විශ්වාස කරමි.

ලැබුවා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සියලු දෙනාටත් විදෙස්ගත සියලු ශ්‍රී ලාංකිකයන්ටත් සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන අතරම ඔබ සියලු දෙනාගේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමි.

මෛත්‍රීපාල සිරිසේන,
හයවන විධායක ජනාධිපති,
සභාපති - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

i. අංක 61, මහගමසේකර මාවත, කොළඹ 07
No: 61,Mahagamasekara Road, Colombo 07
T: +94 112 081 225/6 Fax: +94 112 081 229

@maithripalas
@maithripalaS

Email: info@maithripalasirisena.lk
Web: www.maithripalasirisena.lk

ii. නව නගරය පාර, පොළොන්නරුව
New Town, Polonnaruwa
T: +94 272 222 301 Fax: +94 272 223 901